

## අප සූදානම්ද?

නව වසරක් එළඹිලා. මාර රත්වීමක්. එලියට බැහැල කොහේවත් යන්න බැරි තත්වයක් තිබුණ නිසා. දවසම වගේ ගත කලේ ගේ පිටිපස්සේ ගහක් යට දිග පුටුවක දිගා වෙලා සිසිල් කරපු සෝම පානෙකුත් ළග තියාගෙන හොඳ කල්පනාවක් දාගෙන. වැඩි පුරම අපේ ජීවිත වල ඇති පරිවර්තන ගැන.

අවුරුද්දක මුල කියන්නෙ යමක් අරඹන්න හොඳ කාලයක් කියලනේ සම්මතය. ව්‍යාපාරයක්, ගණු-දෙනුවක්, නව සම්බන්ධකමක් ඉන් ප්‍රධානයි. මේවා



කරන්න අපි අවුරුද්දේ කාල වකවානු මාස දෙකක් අළුතින් හිනන්න පටන් ගන්න පුළුවන්. මේවා සමා-ජයේ තදින්ම මුල්බැස ගත් සම්මත. අපි මේවාට එරෙහිව යන්න ගිහින් කාලයක් වයසත් එක්ක අපිත් ඒවටම අනුගත වෙන හැටි මම කල්පනා කලේ.

අපි ඒ දවස්වල තර්ක කලේ බුදුනුත් කියලා තියෙන්නේ වැඩක් කල යුතුම වෙලාව තමයි හොඳම වෙලාව කියලනේ. අපිත් ඒ අනුව තදින්ම කටයුතු කරපු කාලයකුත් තිබුණා. ඒත් අපි එක්ක හිටපු බො-හොම දෙනෙක් අර රටාවට නිකම්ම ගොනු වෙන හැටි. අපි මේ කාගෙන අපේ වගේම ඉන්න එකේ තේරුමක් තියෙනවද කියලත් වේලාවකට හිතෙනවා. තාරුණ්‍ය ගෙවී ගිහින් ජීවිතේ පදම් වෙනකොට ජීවත් වෙන වටපිටාවට ගැලපිගෙන එනකොට අර වීරියෙන් කරන්න හදපුව දියවෙලා යන හැටි ගැන මං හිතුවේ. මේ කියන්නේ මං නැකත් වෙලාවල් ගැන විශ්වාස කරන්න පටන් අරන් කියලා නෙවෙයි. අපි අකමැත්තෙන් හරි නොදැනුවත්ව හරි ඒවට ඉඩ-දෙන්න වෙලා තියෙන හැටි. ලිපක් මොලවන එක දිශාව බලල කිරිබත් කන එක හිස තෙල් ගාන එකේ ඇති කජ්ජක් නැති බව තේරෙනවා. ඒත් ඉතිං සමූහයක් වශයෙන් මේවා කරන එකෙත් පොඩි ආතල් එකක් තියෙනවා නේ. අමනාපෙට කියනව නෙවෙයි. බෞද්ධයාට එරෙහිව බෞද්ධ දර්ශනය ගැන කතා කල ආමිසයට වඩා ප්‍රතිපත්ති ගැන කතා කරපු මගේ හොඳ මිත්‍රයෙක් දැං පන්සල් යන හැටි දැක්කම මට හිනා. හිනා වෙවී මාත් ඌත් එක්ක යනවා.

සම්මතයට එරෙහි වෙන එක ඒක බිඳිනවට වඩා ලේසියි මගේ හිතේ. කමක් නැහැ. කැමති කැමති අය කැමති කැමති විදියට ඒව කරපුවාවේ. සේරම අල්ලලා දාලා හෙට ඉඳලා ආපහු වෙනස් විදියට ආරම්භ කරන්න ඕනේ කියලා හිතලා ටිකක් වෙලා ගියහම තමයි මතක් උනේ අද 1 වෙනිදා නේ කියලා. හෙට ඉඳලා අළුතෙන් පටන් ගන්න කොට මං ආපහු සම්මතේට අහුවෙලා. හඃ හඃ

## ගිණිකෙළි



මෙහේ ආරක්ෂක අංශ සැක පිට අත් අඩංගුවට ගත් පුද්ගලයින්ගෙන් හෙලි කරගත් තොරතුරු අනුව ඔවුන්ගේ අංක එකේ ඉලක්ක වෙලා තිබුණ Flinders Station එකයි Fedaration Square එකයි නිසා මේ පාර ගිණි කෙළි බලන්න යන ප්‍රමාණය අඩු වෙයි කියලා බොහෝ දෙනා හිතුවේ. මේ වගේ වෙලාවට තත්වය කොහොමද කියලා බලන උනක් තාමත් ඇගේ තියෙන නිසා ගියා 31 රෑ සිටි එක පැත්තේ.

පිස්සු හැදෙනව. චූටි මල්ලියට හැරෙන්නත් ඉඩක් නැහැ. වෙනදට වැඩිය සෙනගක් මේ පාර ආ බව ආරංචි උනා. ඒක දැක්කම ඇති උනේ මාර සතුටක්. එකක් මිනිස්සු කඩාකප්පල්කාරීන්ගේ තර්ජන තඹේකට මායිම් නොකරපු එක. අනෙක රටේ ආරක්ෂක විධිවිධාන ගැන ජනතාවට ඇති විශ්වාසය තහවුරු වීම විශාල සහභාගීත්වයෙන් පෙන්නුම් කලා. රටක ජනතාව ප්‍රශ්න වලට මුහුණ දිය යුත්තේ මේ ආක-ාරයටයි. අප අතර කොතෙක් ප්‍රශ්න තිබුණත් අප භුක්ති විඳින ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සමානාත්මතාවය අනිදහස් ජීවන රටාවන් වෙනස් කිරීමට කවුරුන් හෝ උත්සාහ දරණවානම් ඊට එරෙහිව කොන්දේසි විරහිතව එකතු විය යුතුයි. මට අනුව නම් ජනතාව ඒ බව නිහඬව ඔප්පු කළා. හැබැයි තව කාරණයක් මට දුක ඒක නිසා. කෝ මේ ඔසී සුදු ජනතාව බැලු බැලු අත හිටියේ නේක වර්ණ ජනතාවක්. ආරක්ෂක අංශ විතරයි ඔසී. ඒකෙත් හැටි. ඒ මහත්වරුන්ගේ ආරක්ෂාව ඇතිව ගිණිකෙළිත් මෙවර වෙනදට වඩා දිගු වේලාවක් තිබුණ නිසා ඒකත් හොඳට බලල පාර ගං ඉවුර පැත්තේ රවුමකුත් ගහලා පාන්දර ජාමේ කෝච්චියෙන් නොමිලේම ගෙදර ආවා.

## යන්ත්‍ර රාජයා

මම කේන්දර ග්‍රහපලාපල හූනු කපුටු සාස්තර ගැන කොහොමත් විශ්වාසයක් නැත්තේ පවුලෙන්ම ලැබුණු පුරුද්දක් නිසා වෙන්න ඇති. ඒත් ඒ පිළිබඳව විශ්වාස කරන මිනිස්සුන්ගෙ අයිතියට ගරහන්නත් මම කිසි වෙලාවක උත්සාහ කරන්නෙත් නැහැ. තම තමන්ගේ නැණ පමණින් කටයුතු කරගත්තාවේ කියන තැන මම ඉන්නේ.

ඒත් මරිමෝල් වැඩ වල සීමාව පනිනවා දැක්කම නම් මගේත් රතු කට්ට පනිනව. අවිද්‍යාවෙන් මෝහයෙන් වෙලිලා හිටපු භාරතයේ ජනතාව බුදුන් වහන්සේ බුදු දහමෙන් මුදව ගත්තා වගේ ගනින්නාන්සේලා ඕසෙට හිටියත් 2500 පුරාණ



ඉතිහාසයක් තිබුණත් අවිද්‍යාවට මෝහයට එරෙහිව හරියටම අවි ගත්තේ 60 - 70 දශකයේ කොවුර්ලා, කාලෝලා, වල්පොල රාහුල හාමුදරු-වෝ ප්‍රමුඛ හේතුවාදීන්ය කියල අපි අහල තියෙන්නේ. ඒ දුන්න ගේමෙන් රටෙන් බාගයක් විතර අඳුරෙන් එළියට ආවය ඒක ක්‍රමානුකූලව වර්ධනය වෙමින් තිබුනය කියන එකත් සත්‍යයත්. එහෙම ගොඩ ආව රට ආයෙත් 180 ක් ආපහු කැරකිලා කේන්දර කාරයොයි සාස්තර කාරයොයි පාලනය කරන සයිස් එකට පහුගිය කාලේ පත් උනා කියන එක අරිටත් වඩා ඇත්තක් බව හැමෙ-ර්ම දන්නවනේ.

තාමත් වැඩේ වෙන්නෙ ඒ විදියට බවයි අපට පේන්නෙ. ඒ ගැන චූටි මල්ලිට තියෙන්නේ මාර ශෝකයක්. ඒකත් ඉවසන්න පුළුවන්. ඒ වගේනේ යකෝ එකම මෙහේ වෙනකොට ඉවසන් ඉන්න පුළුවන්ද ? දැං මේ ඕස්ට්‍රේලියාවෙන් යන්ත්‍ර සූත්‍ර වලින් විභාග පාස් කර දෙන මහා මන්ත්‍රාචාර්ය වරු වැඩම කරලනේ. පිස්සු හැදෙනවා ලොක්කා. එක අතකට ගුරාලට දොස් කියලා මොකටද ? මේ මහා විභාග පාස් කර දෙන විභාග යන්ත්‍ර රාජයා තමන්ගේ දරුවන්ට වියදම් කරලා පලඳවන්න සූදානම් දෙමව්පියන් සෙට් වෙලා ඉන්නව නම්. අනේ කාලේ..... විභාගෙට ඉස්සෙල්ල පන්සලකට කෝවිලකට ගිහින් මලක් පූජා කරලා ආශිර්වාදයක් ලබා ගන්න එක නම් ඉවසගෙන ඉන්න පුළුවන්. ඒ දෙයියනේ ගෙඩි පිටින්ම විභාගේ පාස් කරන්න යන්ත්‍ර රාජයා ඉන්න කොට පාඩම් මක්කටෙයි. මේවා ඉතිං කාට කියන්නද ? අපේ මිනිස්සුන්ගේ පට්ට මරි මෝඩ කම් ගැන කණගාටු වෙනවා ඇර මොනව කරන්නද ? එස් වඃ හඃ කියලා අපිත් කියමු.

## ඔයා මාරයි සන්නා

පහුගිය දවස්වල පොත් දෙකක් කියෙව්වා. පොත් එක දිගට කියවන්න ලැබෙන්නෙ කලාතුරකින්. ජීවිතේ ඒ තරමට අවිවේකියි. අර ශ්‍රීනාත් අයිය කිව්ව වගේ අපි සැපට දුක් විඳිනවා තමයි. ජීවිතේ ආස කරන දේ කො-පමණ තියෙනවද ඉටු කරගන්න. අමාරුවෙන් හරි බොහෝ දේ ඉටු කර ගත්තේ මෙතෙන්ට සෙට් උන නිසා. නැත්නම් ඉතිං බොහොමයක් දේ බලාපොරොත්තුව විතරක් වෙවී තැනකට එන්න නම් කොපමණ කට්ටක් කන්න ඕනෙද ? කොපමණ දේ මග හලන්න වෙනවද ? හරි.. මේ අර කියවපු පොත් දෙකෙන් පළමුවැන්න ''-අම්මා'' ගෝර්කිගේ නොවෙයි සන්නස්ගලගේ. බොහෝම දෙනා කියවල ඇති මේ වෙනකොට. බොහෝ කලකට පසු අකුරක් වාක්‍යයක් නෑර කියවපු පොත. ඒ නිසා පොඩි සටහනක් දාන්න හිතුණා පොත ගැන නොවෙයි කියෙව්වට පස්සෙ මට වුණ දේ ගැන.

චරිත කතා නම් නේරුගේ ගාන්ධිගේ ඉඳලා වික්‍රමසිංහ හරහා සරත්චන්ද්‍ර දක්වා කියවලා තියෙනවනේ එක පෙලට. අවංකවම කියන්නේ ඒ සෑම පොතකින්ම විඳපු සාහිත්‍ය රසයට වඩා මේක වෙනස්. මේකේ මට අනුව නම් අවසා-නයෙදි දැනුනේ ඇඟ කිලිපොලා යන ගතියක්. මට එහෙම දැනුනේ පොඩි අයියලගේ පොත් අස්සේ තිබිලා ඒ කාලේ කියවපු ඩීමන් ආ-නන්දගේ ඩුකියුලා මනාලියගේද මොකක්ද කියවපු දවසේ විතරයි. එතකොට මං පොඩියි. ඒක දැනුනේ බයට. මේකදි දැනුනේ දරන්න බැරි අවංකකමට හා ස්වයං විවේචනාත්මක කමට මිනිහෙක් මෙහෙම ලියන්නේ කොහොමද කියලා මාව තැති ගැන්වුනා. ඒක විග්‍රහකරන්න අම-



ාරුයි මට සන්නස්ගල අම්ම ගැන කියන්නේ ලියන්නේ මේ ලෝකෙ කවුරුවත් නැති තැනකට ගිහින් බුත් සරණ අල හොරෙන් කාපු තැන ඉඳලා සොසේජස් දක්වා ලියන්න පුළුවන් වෙන්නෙ ඒකයි. නිර්භීතම වැඩේ එහෙම ලියලා ඒක සමාජයට අතහැර දාලා ඒ සමාජෙම ජීවත් වෙනවා. මේක ලියලා දැං කාලයක් වෙනවා. දැලි ගෑවුනත් රෙදි ගැලවුනත් කාටවත් නෝ කතා නෝ සිනා සේරම අපූරුවට කාගෙන ඉන්නවා. සන්සන්ගලත් ඉන්නවා. ඒක මාර ටැලන්ට් එකක්. මට පිස්සු හැදුනේ ඒකයි.

මං කොහොමවත් සන්නස්ගලගේ ශෛලියට කොහොමත් මනාපයි. අනෙක මට හිතෙන්නේ සිංහල ඉගෙන ගන්න ඕනේ විෂයක් කලේ ඔහු. ඒකට අප සැලකිය යුතුමයි. ඒත් ඔහුගේ වර්ථමාන දේශපාලනය මට පට්ට අරහං. ඒකත් කියන්න ඕනෙ. දැං කල්පනා කරල බැලුවම වෙලාවකට හිතෙන්නේ ගෝර්කි ඇත්තටම මොනවද අම්ම ගැන ලියල තියෙන්නෙ කියලා.

## මේකත් එක විදිහක පොතක්

පොත අංක දෙක පල වුනේ ගිය සතියේ. දවස් තුන හතරකින්ම ලබා ගන්න හැකි වුණා ඥාතියෙකුගේ උපකාරයෙන්. මාර කට්ටක් කාලා පොත හොයාගෙන තියෙන්නේ. නමට මාර ඉල්ලුමක් තියෙන්නේ. ''ජ.වි.පෙ. දෙවන කැරැල්ල 88 - 89'' කතෘ ධර්මන් වික්‍රමරත්න. දැං මේ පොත කියවන්න තියෙන උනන්දුව ගිය අවුරුද්දෙ තිබ්බ නම් කොළඹින් ලාල් කාන්තටත් පාර්ලිමේන්තු යන් තිබුණා කියල මගේ ඥාතියා කිව්වෙ. පිටු 879 යි. මිල රු. 1500.00 යි. ගත්ත ගමන් කියෝගෙන කියෝගෙන හොයාගෙන හොයාගෙන ගියා අළුත් දෙයක් අන්තිම වෙනකම්. හාහ් සද්දෙයි දුමයි විතරයි. වැඩ නැහැ.

මේ පොත ලියලා තියෙන්නේ බාලයින්ට කියලයි මට හිතෙන්නෙ.

කතන්දරේ දන්න මිලියන ගානක් ඉන් රටේ හෙට ඉපදෙන ඔවුන්ට පොත් ලියන්නේ අභවල් එකකටද ? කියලා මටනම් හිතෙන්නෙ. කතෘ මීට කලින් ලියපු ''මැයි දින ඉතිහාසය'' හා ''ලාංකික ශිෂ්‍ය සටන් ව්‍යාපාරය'' පොත් දෙකම මාලඟ තියෙනවා. මේ පාර ඒ පොත් දෙකයි ලේඛනාගාරයෙන් ලබාගත් 87-90 දක්වා දිවයින පුවත් පත්‍ර වර්ගය මතට සම්පිණ්ඩනය කරලා කෘතියක් විදියට අපිට දෙනවා.



අර්ධ සත්‍යයත් අතිශයෝක්තියත් බොරුවත් එක පදමට අනල ලියල තියෙන මේ පොත මහින්ද රා-ජපක්ෂටම පූජා කරපු රක ගැන නම් පුදුම වෙන්න දෙයක් නැහැ. එක වල්ලෙ පොල්.

මට කණගාටුව මේවා කියවන ඉතිහාසය නො දන්නා අලුත් පරපුරේ අය මේව ඇත්ත කියල හිතන්න ගන්න එක ගැනයි. අනාගතයට ඉතිරි කරල දෙන්න ඕනෙ සැබෑ ඉතිහාසය මිසක් මේ වගේ විකෘති ඉතිහාසයක් නෙවෙයි.

මේව නම් දෙකයි පනහේ වැඩ තමුන්ගේ වෘත්තීය හැකියාව මේ විදිහට අවභාවිතාවේ යොදවන්නේ ඇයි. ඒක තමුංගේ නමට නේද හොඳ නැත්තේ. කතෘ තුමන් නොදන්නවාට මේ බොහෝ ජාති මට්ටමේ සිද්ධීන් වලට සම්බන්ධ වූ අදත් ජීවතුන් අතර ඉන්නා බොහේ දෙනෙක් මේවා පිළිබඳ සත්‍ය දන්න බව දන්වා සිටින්නට කැමති බවත් ලියා තබමි. ලූලා නැති වලට කනයා පණ්ඩිතයා යන්න මතක් වෙන අවස්ථා මේ පොතේ තිබූ බවත් ලියන්න කැමැත්තෙමි. වැඩි පුර කතා නැතිව සංවේගයෙන් නවතිමි.

**චූටි මල්ලි**